සැ.යු.- (i) 2015.04.17 දින පළ වූ අංක 1911 දරන ගැසට් පත්‍රයේ I : III සහ IV (අ) කොටස් පළ නොවීය.

(ii) මෙවර පළවන ගැසට් පත්‍රයේ VI කොටස යටතේ 2014.12.31 දිනට නියමිත විවාහ උප්පැන්න හාමරණ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර්වරුන්ගේ නාමාවලියක් ඉංග්‍රීසි භාෂාවෙන් පමණක් පළවේ

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 1,912 - 2015 අප්‍රේල් මස 24 වැනි සිකුරාදා - 2015.04.24**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)

## IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත )

| | පිටුව | | පිටුව |
|---|---|---|---|
| තනතුරු-ඇබෑර්තු ... ... ... ... | 738 | පළාත් පාලන සහා ඡන්ද ආඥාපනත යටතේ දැන්වීම ... | — |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... ... | — | ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශන ... ... ... | — |
| පළාත් පාලන නිවේදන ... ... ... ... | 753 | අයවැය ලේඛන ... ... ... | — |
| අතුරු ව්‍යවස්ථා ... ... ... ... | — | දේපළ විකිණීම් ... ... ... | — |
| | | විවිධ දැන්වීම් ... ... ... | — |

සැ.යු.- ආර්ථික සේවා ගාස්තු (සංශෝධන) පනත් කෙටුම්පත සහ මුදල් පනත් කෙටුම්පත 2015 මාර්තු මස 27 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වැනි කොටසේ අතිරේකයන් වශයෙන් පළ කරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයකම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතුය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි ***ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට** පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2015 මැයි මස 15 දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2015 අප්‍රේල් මස 30 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය.**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතුය."*

**ඩබ්ලිව්. ඒ. ඒ. ජී. ෆොන්සේකා,**

රජයේ මුද්‍රණාලයාධිපති. *(වැ.බ.)*

2015 ජනවාරි මස 22 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

# තනතුරු ඇබෑර්තු

## මහරගම නගර සභාව

### බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ පුරප්පාඩු තනතුරු සඳහා බඳවා ගැනීම

බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ මහරගම නගර සභාවේ පුරප්පාඩු වී ඇති පහත දැක්වෙන තනතුරු සඳහා මෙම නිවේදනයේ සඳහන් සුදුසුකම් සපුරා ඇති බස්නාහිර පළාතේ ස්ථිර පදිංචිකරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

| 01. *තනතුර හා වැටුප් පරිමාණය* | *අධ්‍යාපන සුදුසුකම්* |
|---|---|
| i. මුරකරු II, තනතුරු - 02<br>වැටුප් පරිමාණය : රු. 11,730-10x120-10x130-10x145-12x160 රු.17,600 (රා.ප.ච. 6/2006iv හි PL-1-2006A වැටුප් පරිමාණයේ 12 වන පියවර ආරම්භක වැටුප වේ.) | I. අධ්‍යාපන සුදුසුකම්<br>*(අ)* අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේ දී එක් වරක දී කවර හෝ විෂයයන් 06ක් සමත් විය යුතුය. |
| ii. සෞඛ්‍ය කම්කරු III, තනතුරු - 01<br>මාසික : රු. 11,730-10x120-10x130-10x145-12x160 රු.17,600<br>(රා.ප.ච. 6/2006 පරිමාණයේ පියවර ආරම්භක වැටුපවේ.) | I. අධ්‍යාපන සුදුසුකම්<br>*(අ)* 8 වන ශ්‍රේණිය 9 වසර සමත් වී තිබිය යුතුය. |

02. *පොදු සුදුසුකම් :-*

(i) අයදුම්කරුවන් ශ්‍රී ලංකාවේ පුරවැසියන් විය යුතු යි ;

(ii) අයදුම්පත් භාරගන්නා දිනට පූර්වාසන්න වසර 03ක කාලයක් බස්නාහිර පළාත තුළ ස්ථිර පදිංචිකරුවෙකු විය යුතු ය ;

(iii) යහපත් චරිතයකින් හා මනා ශරීර සෞඛ්‍ය තත්ත්වයකින් යුක්ත විය යුතු ය ;

(iv) අයදුම්පත් භාරගැනීමේ අවසන් දිනට වයස අවුරුදු 18ට නොඅඩු හා 45ට නොවැඩි විය යුතුය. (දැනටමත් රාජ්‍ය /පළාත් රාජ්‍ය සේවයේ නියුතු ස්ථිර සේවකයින් සඳහා මෙම උපරිම වයස් සීමාව අදාළ නොවේ).

03. *බඳවා ගැනීමේ ක්‍රමය :-* රා.ප. චක්‍රලේඛ 24/95 විධි විධාන අනුව බඳවා ගැනීම සිදු කෙරේ.

04. අයදුම්පත්‍රය සමග පහත සඳහන් සහතිකවල පිටපත් අමුණා එවිය යුතුය.

(i) උප්පැන්න සහතිකයේ පිටපත ;

(ii) අධ්‍යාපන සහතික පිටපත් ;

(iii) පදිංචිය සනාථ කිරීම පිණිස ප්‍රාදේශීය ලේකම් විසින් අනු අත්සන් තබන ලද ග්‍රාම සේවක සහතිකයේ පිටපත ;

04. *ඉල්ලුම් කළ යුතු ආකාරය :-*

(i) මෙම නිවේදනයේ සඳහන් ආදර්ශ ආකෘතිය පරිදි සකස් කරන ලද අයදුම්පත් 2015.05.08 වැනි දින හෝ ඊට පෙර "ලේකම්" මහරගම නගර සභාව, මහරගම" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය ;

(ii) අයදුම්පත බහාලන කවරයේ වම් පස ඉහළ කෙළවරේ ඉල්ලුම් කරන තනතුර සඳහන් කල යුතුය ;

(iii) දැනටමත් රාජ්‍ය/පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් තම ඉල්ලුම්පත් තම සේවා ප්‍රධානියා මගින් එවිය යුතුය ;

(iv) ඉහත සඳහන් කොන්දේසිවලට අනුව නියමිත පරිදි ඉදිරිපත් කරනු නොලබන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

* අයදුම්පත් කැඳවීමෙන් පසු හෝ කැඳවන අතරතුර දී මෙම නිවේදනය සංශෝධනය කිරීම, අවලංගු කිරීම හෝ බඳවා ගැනීම් ප්‍රමාද කිරීමේ පූර්ව බලය මහරගම නගර සභාවේ ලේකම් සතුවේ.

කේ. ටී. ගම්ලත්,
ලේකම්,
මහරගම නගර සභාව.

2015 ක් වූ අප්‍රේල් මස 09 වැනි දින,
මහරගම නගර සභා කාර්යාලයේ දී ය.

**ආදර්ශ අයදුම්පත්‍රය**

***බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ පුරප්පාඩු පිරවීම***

*මහරගම නගර සභාව*

*....................................... තනතුර සඳහා බඳවා ගැනීම*

01. මුලකුරු සමග නම : ———— ;

02. මුලකුරුවලින් හැඳින්වෙන නම් : ———— ;

03. ස්ථිර ලිපිනය : ———— ;

04. ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය : ———— ;

05. දුරකථන අංකය :————————.

06. ජාතික හැඳුනුම්පත් අංකය :————————.

07. උපන් දිනය : අවුරුදු : ———— ; මාස : ———— ; දින : ———— ;

08. අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස : අවුරුදු : ———— ; මාස : ———— ; දින : ———— ;

09. ස්ත්‍රී/පුරුෂ භාවය : ———— ;

10. විවාහක/අවිවාහක බව : ———— ;

11. ශ්‍රී ලංකාවේ පුරවැසියෙක් වන්නේ උපතින් ද ? ලියාපදිංචියෙන් ද යන වග : ———— ;

12. අධ්‍යාපන සුදුසුකම් : (සහතිකවල පිටපත් ඇමිණිය යුතුය.)

(i) අ.පො.ස. (සා.පෙළ) විභාගය ඃ
සමත් වර්ෂය හා විභාග අංකය:————————.

| *අනු අංකය* | *විෂයය* | *සාමාර්ථය* | *අනු අංකය* | *විෂයය* | *සාමාර්ථය* |
|---|---|---|---|---|---|
| 01. | | | 06. | | |
| 02. | | | 07. | | |
| 03. | | | 08. | | |
| 04. | | | 09. | | |
| 05. | | | 10. | | |

(ii) අවසන්වරට සමත් වූ ශ්‍රේණිය/වසර :————————.

13. වෙනත් සුදුසුකම් : ———— ;
14. සේවා පළපුරුද්ද ඃ

13.1 දැනට සේවය කරන ආයතනය : ———— ;
13.2 දැනට දරන තනතුර : ———— ;
13.3 එම තනතුරට පත් වූ දිනය : ———— ;
13.4 මීට පෙර සේවය කරන ලද ස්ථානය හා දරන ලද තනතුර:————————.

මෙහි සඳහන් කර ඇති තොරතුරු මාගේ දැනීමේ හා විශ්වාසය පරිදි සත්‍ය හා නිවැරදි බවට ප්‍රකාශ කරමි. මෙම බඳවා ගැනීම පිළිබඳ කොන්දේසි අනුව මා විසින් මෙහි සාවද්‍ය තොරතුරක් ඉදිරිපත් කර ඇති බව බඳවා ගැනීමට පෙර හෝ පසුව අනාවරණය වුවහොත් කිසිදු වන්දියක් නොගෙවා සේවයෙන් පහකරනු ලැබීමට යටත් වන බව මම දනිමි.

..............................................
අයදුම්කරුගේ අත්සන.

දිනය : ..............................................

දැනටමත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා ආයතන ප්‍රධානියාගේ සහතිකය

මෙම ඉල්ලුම්කරු වන ...................................... මයා./මිය./මෙනවිය දැනට මෙම දෙපාර්තමේන්තුවේ /ආයතනයේ .............................................. වශයෙන් සේවය කරයි. ඔහු/ඇය මොන ආකාරයේ හෝ විනයානුකූල දඬුවමකට (අවවාද කිරීම හැර) භාජනය වී නොමැති බව සහතික කරන අතර, ඔහු/ඇය විසින් ඉදිරිපත් කර ඇති අයදුම්පත නිර්දේශ කර ඉදිරිපත් කරමි./නොකරමි.

..............................................................................
ආයතන ප්‍රධානියාගේ අත්සන.

දිනය : ..............................................
පදවි නාමය හා ආයතනය : ..............................................

04 - 840

---

**මධ්‍යම පළාත් සභා රාජ්‍ය සේවයේ පල්ලේපොල ප්‍රාදේශීය සභාව සඳහා වැඩ පරිපාලක/සෞඛ්‍ය කම්කරු තනතුරු සඳහා බඳවා ගැනීම**

මධ්‍යම පළාත් රාජ්‍ය සේවයේ පල්ලේපොල ප්‍රාදේශීය සභාවේ පුරප්පාඩු වී ඇති පහත උපලේඛනයේ සඳහන් තනතුරුවලට බඳවා ගැනීම සඳහා මෙම නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති පල්ලේපොල ප්‍රාදේශීය සභා සීමාව තුළ ස්ථිර පදිංචිය ඇති අයගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. (පල්ලේපොල ප්‍රාදේශීය සභාවේ දැනටමත් සේවයේ නියුතු ස්ථිර අනියම් ආදේශක සේවකයන්ට ප්‍රමුඛතාවය දක්වනු ලැබේ.)

| *අනු අංකය* | *තනතුරු නාමය* | *පුරප්පාඩු තනතුරු සංඛ්‍යාව* | *වැටුප් ක්‍රමය* | *අධ්‍යාපන සුදුසුකම්* |
|---|---|---|---|---|
| 1. | සෞඛ්‍ය කම්කරු | 03 | PL -1-2006 A රු. 11,730- 10 x 120 - 10 x 130 - 10 x 145 - 12 x 160 - රු. 17,800 | අවම වශයෙන් 8 වැනි ශ්‍රේණියට (9 වසරට) නියමිත විෂයය නිර්දේශය සම්පූර්ණ කර තිබිය යුතු ය. |
| 2. | වැඩ පරිපාලක III පන්තිය (ආ) | 01 | MN -1-2006A - රු. 13,120 - 10 x 145 - 11 x 170 - 10 x 240 - 10 x 320 - රු. 22,040 | අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සා.පෙළ) විභාගයෙන් දෙවරකට නොවැඩි වාර ගණනක දී ගණිතය/විද්‍යාව සිංහල භාෂාව යන විෂයයන් ද ඇතුළුව විෂයයන් 06කින් සමත්වීම.<br><br>අදාළ තනතුරට නියමිත කාර්මික නිපුනතා පත්වීම් බලධාරියා විසින් අපේක්ෂා කරන මට්ටමට අත්සන් කරගෙන තිබිය යුතු ය.<br><br>(අ) පිළිගත් කාර්මික විද්‍යාලකින් තනතුරට අදාළව ජාතික තාක්ෂණය පිළිබඳ සහතිකය ;<br>සහ<br>(ආ) පිළිගත් ආයතනයක අදාළ ක්ෂේත්‍රයේ වසර 03ක සතුටුදායක සේවා පළපුරුද්ද |

*02. බඳවා ගැනීම සඳහා පොදු කොන්දේසි :-*

(i) අයදුම්කරුවන් ශ්‍රී ලංකාවේ පුරවැසියන් විය යුතු ය.
(ii) අයදුම්කරු අයදුම්පත් භාරගන්නා දිනට පූර්වාසන්න වසර 03ක කාලයක් පල්ලේපොල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ස්ථිර පදිංචිකරුවකු විය යුතු ය.

(iii) අයදුම්පත් භාරගන්නා දිනට වයස අවුරුදු 18ට නොඅඩු සහ අවුරුදු 45ට නොවැඩි විය යුතු ය. (දැනටමත් රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ සේවකයින් සම්බන්ධයෙන් උපරිම වයස් කාණ්ඩය බල නොපානු ඇත. මෙම සහනය ලැබෙන්නේ රාජ්‍ය/පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර සේවකයින්ට පමණී.)

(iv) පල්ලේපොල ප්‍රාදේශීය සභාවේ දැනට තාවකාලික/අනියම්/ආදේශක/කුලී පදනම මත සභා වැඩ ඒකකයේ සේවය කරනු ලබන සේවකයින් කෙරේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(v) අයදුම්කරු යහපත් චරිතයකින් හා මනා ශරීර සෞඛ්‍යයකින් සිටිය යුතු අතර දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියකින් වරදකරු වී දඬුවම් ලැබූවකු නොවිය යුතු ය.

(vi) රජයේ පළාත් පාලන හෝ සංස්ථා සේවයෙන් පහකරනු ලැබූවකු නොවිය යුතු ය.

*03. සේවයේ නියුක්ත කරලීමේ කොන්දේසි :*

(i) මෙම තනතුර ස්ථිර ය. විශ්‍රාම වැටුප් සහිතය.

(ii) වැන්දඹු, වැන්දඹු පුරුෂ හා අනත්දරු අරමුදලට දායකත්වය හිමිවේ.

(iii) පත්වීම අවුරුදු 03ක පරිවාස කාලයකට යටත්වේ.

(iv) මෙම බඳවා ගැනීමේ කොන්දේසි හා රෙගුලාසිවලට අමතරව ශ්‍රී ලංකා ජනරජයේ ආයතන සංග්‍රහයේ රෙගුලාසිවලට ද, රජයේ දෙපාර්තමේන්තු නියෝගවලට ද අනුකූලව ක්‍රියා කිරීමට සියලුම සේවකයින් බැඳී සිටිය යුතුයි.

*04. අයදුම්පත් සමග ඉදිරිපත් කළ යුතු ලිපිලේඛන :*

1. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින් සුදුස්සන් තෝරා ගැනේ.

2. අයදුම්පත්‍රය සමග පහත සඳහන් සහතිකවල පිටපත් අමුණා එවිය යුතු අතර මුල් පිටපත් සම්මුඛ පරීක්ෂණයේ දී ඉදිරිපත් කළ යුතු ය.

(i) උප්පැන්න සහතිකය ;
(ii) අධ්‍යාපන සහතිකය ;
(iii) තම පදිංචිය සනාථ කිරීම පිණිස ප්‍රාදේශීය ලේකම්වරයාගේ සහතිකය ;
(iv) මෑතක දී ලබාගත් චරිත සහතික 02ක් (එක් සහතිකයක් පදිංචි ප්‍රදේශයේ ග්‍රාම නිලධාරිගෙනි) ;
(v) වෘත්තීය හො පළපුරුද්ද පිළිබඳ සහතික.

රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ හෝ පළාත් පාලන සේවයේ නියුක්ත වූවන් නම් අයදුම්පත් දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් ඉදිරිපත් කළ යුතුය.

05. මූලික සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් පමණක් සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවීම් කරනු ලැබේ.

*06. අයදුම්කළ යුතු ආකාරය :*

අයදුම්කරුවන් මෙහි දක්වා ඇති ආදර්ශ අයදුම්පත්‍රයට අනුව පිළියෙල කරන ලද අයදුම්පත් ඉල්ලුම් කරන තනතුර කවරයේ වම්වස ඉහළ කෙළවරේ ලියා 2015.05.15 දින හෝ ඊට ප්‍රථම ලැබෙන සේ ලේකම් ප්‍රාදේශීය සභාව පල්ලේපොල යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. (දැනටමත් පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් තම අයදුම්පත්‍රය ආයතන ප්‍රධානියා මගින් ඉදිරිපත් කළ යුතුය. නියමිත දිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

අයදුම්පත් කැඳවීමෙන් පසු හෝ කැඳවන අතරතුර දී මෙම බඳවා ගැනීම ප්‍රමාද කිරීම හෝ වෙනස් කිරීම හෝ මෙම නිවේදනය අවලංගු කිරීම හෝ සංශෝධනය කිරීමේ පූර්ණ බලය පල්ලේපොල ප්‍රාදේශීය සභාවේ ලේකම් සතුවේ.

ඩී. එම්. ලලිතා සෝමාවතී,
ලේකම්,
පල්ලේපොල ප්‍රාදේශීය සභාව.

2015 අප්‍රේල් මස 08 වැනි දින,
පල්ලේපොල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

ආදර්ශ අයදුම්පත්‍රය

**පල්ලේපොල ප්‍රාදේශීය සභාවේ පුරප්පාඩුව පවතින ........................................ තනතුර සඳහා බඳවා ගැනීම**

01. අයදුම්කරුගේ සම්පූර්ණ නම : ———— ;
02. මුලකුරු සමග නම : ———— ;
03. ස්ථිර ලිපිනය : ———— ;
04. ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය : ———— ;
05. උපන් දිනය : ———— ; වර්ෂය : ———— ; මාසය : ———— ; දිනය : ———— ;
06. අයදුම්පත භාරගන්නා අවසන් දිනට වයස : ———— ;
07. ජාතික හැඳුනුම්පත් අංකය : ———— ;

08. විවාහක /අවිවාහක බව : ———— ;

09. ස්ත්‍රී/පුරුෂ භාවය :————.

10. ඔබ ශ්‍රී ලංකා පුරවැසියෙකු වන්නේ පරම්පරාවෙන් ද? ලියාපදිංචි වීමෙන් ද යන වග ? : ———— ;

11. අධ්‍යාපන සුදුසුකම් (සහතිකවල ඡායා පිටපත් අමුණා එවන්න) : ———— ;

අ.පො.ස. (සා.පෙළ) විභාගය :

සමත් වර්ෂය : විභාග අංකය :

| විෂයය | සාමාර්ථය | විෂයය | සාමාර්ථය |
|---|---|---|---|
| 01. | | 05. | |
| 02. | | 06. | |
| 03. | | 07. | |
| 04. | | 08. | |

අ.පො.ස. (උ.පෙළ,) විභාගය

සමත් වර්ෂය : විභාග අංකය :

| විෂයය | සාමාර්ථය |
|---|---|
| 1. | |
| 2. | |
| 3. | |
| 4. | |

12. (i) වෙනත් අධ්‍යාපන සුදුසුකම් : ———— ;
(ii) වෘත්තීය සුදුසුකම් : ———— ;
(iii) සේවා පළපුරුද්ද : ———— ;

1. දැනට සේවය කරන ආයතනය : ———— ;
2. දැනට දරන තනතුර : ———— ;
3. එම තනතුරට පත් වූ දිනය : ———— ;
4. මීට පෙර සේවය කරන ස්ථානය හා දරන ලද තනතුර : ———— ;

13. ඔබ දැනටමත් මෙම සභාවේ සේවයේ නියුක්තව සිටින්නේ නම් දැනට දරන තනතුර ස්ථිර/අනියම්/තාවකාලික/කොන්ත්‍රාත්/ආදේශකද යන වග එම තනතුරට පත් වූ දිනය : ———— ;

14. ඔබ කවරදාක හෝ චෝදනාවක් සඳහා උසාවියකින් වරදකරු කරනු ලැබ තිබේද ?

මෙම අයදුම්පත් මා විසින් සපයා ඇති තොරතුරු මා දන්නා තරමින් නිවැරදි බව ප්‍රකාශ කරමි. ඉහත සඳහන් තොරතුරු අසත්‍ය බවට ඔප්පුවුවහොත් මා සේවයට බඳවා ගැනීමට පෙර නුසුදුස්සෙකු වන බව හා පත්වීම් ලැබීමෙන් පසුව එය ඔප්පු වුවහොත් කිසිදු වන්දියක් ද රහිතව සේවයෙන් පහ කිරීමට යටත්වන බව ද දනිමි.

.................................................
අයදුම්කරුගේ අත්සන.

දිනය : ..................................................

දැනටමත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා ආයතන ප්‍රධානියාගේ සහතිකය

........................................ මයා./මිය./මෙනවිය මෙම ආයතනයේ ................................................ වශයෙන් සේවයේ නියුක්තව සිටියි. මෙම තනතුර සඳහා තෝරාගතහොත් ඔහු/ඇය සේවයෙන් නිදහස් කළ හැක/නොහැක. ඔහු/ඇය කුමන ආකාරයේ හෝ දඬුවමකට භාජනය වී නොමැති බව මින් සහතික කරන අතර ඔහු/ඇය විසින් ඉදිරිපත් කර ඇති අයදුම්පත නිර්දේශ කර ඉදිරිපත් කරමි.

..................................................................................
ආයතන ප්‍රධානියාගේ අත්සන.

දිනය : ..................................................

04 - 851

## දිවුලපිටිය ප්‍රාදේශීය සභාව

## බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ පුරප්පාඩු පිරවීම

දිවුලපිටිය ප්‍රාදේශීය සභාවේ දැනට පුරප්පාඩු වී ඇති පහත සඳහන් තනතුරු සඳහා නියමිත සුදුසුකම් සපුරා ඇති බස්නාහිර පළාත තුළ ස්ථිර පදිංචිකරුවන්ගෙන් පමණක් අයදුම්පත් කැඳවනු ලැබේ :-

| *තනතුරු නාමය* | *පුරප්පාඩු තනතුරු සංඛ්‍යාව* | *වැටුප් පරිමාණය හා ශ්‍රේණිය* | *අධ්‍යාපන සුදුසුකම්* |
|---|---|---|---|
| 01. විදුලි කම්කරු (කාර්යාල සේවක සේවය III) | 01 | PL-1-2006 A - රු. 11,730-10x120-10x130- 10x145-12x160- රු.17,600 | 8 වැනි ශ්‍රේණිය/9 වසර සමත්වී තිබීම |
| 02. සෞඛ්‍ය කම්කරු (කාර්යාල සේවක සේවය III) | 03 | PL-1-2006 A - රු. 11,730-10x120-10x130- 10x145-12x160- රු.17,600 | 8 වැනි ශ්‍රේණිය/9 වසර සමත්වී තිබීම |
| 03. මාර්ග කම්කරු (කාර්යාල සේවක සේවය III) | 02 | PL-1-2006 A - රු. 11,730-10x120-10x130- 10x145-12x160- රු.17,600 | 5 වැනි ශ්‍රේණිය/6 වැනි වසර සමත්වී තිබීම |

*පොදු සුදුසුකම් :*

1. අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස අවු. 18 ට නොඅඩු 45 ට නොවැඩි විය යුතු ය. (දැනට පළාත් රාජ්‍ය සේවයේ නියුතු වූවන් සඳහා අදාළ නොවේ.)
2. ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතු ය.
3. යහපත් චරිතයකින් හා මනා ශරීර සෞඛ්‍යකින් යුක්ත විය යුතු ය.
4. අයදුම්පත් භාරගන්නා අවසාන දිනට පූර්වාසන්නයේ වූ වසර 03 ක කාලය තුළ බස්නාහිර පළාතේ ස්ථිර පදිංචියක් තිබිය යුතු ය.

*බඳවා ගැනීමේ ක්‍රමය :*

* ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් බඳවා ගැනීම සිදු කරනු ලැබේ.

*සේවයේ නියුක්ත කිරීමේ කොන්දේසි :*

1. මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. නියමිත පරිදි වැන්දඹු/වැන්දඹු පුරුෂ අරමුදලට මුදල් ගෙවිය යුතු ය.

2. පත්වීම අවුරුදු 03 ක පරිවාස කාලයකට යටත් වේ.

3 . මෙම බඳවා ගැනීමේ කොන්දේසිවලට අමතරව ආයතන සංග්‍රහයේ කොන්දේසි වලටද, මුදල් රෙගුලාසි වලටද, බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් කලින් කලට පනවනු ලබන වෙනත් කොන්දේසි හා රෙගුලාසි වලටද, පළාත් පාලන ආයතනවලට අදාළ ආඥාපනත්වලට හා විධි විධානවලටද, දිවුලපිටිය ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද නියෝග වලටද අනුකූලව කටයුතු කිරීමට එකඟ විය යුතු ය.

*අයදුම්පත් එවිය යුතු පිළිවෙල :*

අයදුම්කරුවන් මෙහි දක්වා ඇති ආදර්ශ අයදුම්පත්‍රය අනුව පිළියෙල කරන ලද අයදුම්පත්‍ර සම්පූර්ණ කර "ලේකම්, දිවුලපිටිය ප්‍රාදේශීය සභාව, දූනගහ." යන ලිපිනයට 2015.05.12 වැනි දිනට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත් බහාලන කවරයේ වම්පස ඉහළ කෙලවරේ අයදුම්කරන තනතුර පැහැදිලිව සඳහන් කළ යුතු ය. නියමිත දිනට පසුව ඉදිරිපත් කරනු ලබන අයදුම්පත් හා මූලික සුදුසුකම් සපුරා නොමැති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

දැනටමත් රජයේ/පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් තම දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියා මගින් අයදුම්පත් ඉදිරිපත් කළ යුතු ය. අයදුම්පත්‍රය සමග පහත සඳහන් සහතිකවල අනු පිටපත් අමුණා එවිය යුතුය.

1. උප්පැන්න සහතිකය,
2. අධ්‍යාපන සහතිකය,
3. හැඳුනුම්පතේ පිටපතක්,

4. ග්‍රාම නිලධාරි සහතිකය,
5. ඉල්ලුම් කරන තනතුරට අදාළ ශිල්පීය නිපුණතා/ප්‍රවීණතා සහතික,
6. චරිත සහතික දෙකක් (මෑතක දී ලබාගත්).

එච්. එච්. ඒ. ඩී. ඉන්දික අනුරුද්ධ
ලේකම්,
දිවුලපිටිය ප්‍රාදේශීය සභාව,
දූනගහ.

2015 අප්‍රේල් මස 07 වැනි දින,
දූනගහ,
දිවුලපිටිය ප්‍රාදේශීය සභා ප්‍රධාන කාර්යාලයේ දී ය,

**ආදර්ශ අයදුම්පත්‍රය**

***දිවුලපිටිය ප්‍රාදේශීය සභාව***

*බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ ..........................................තනතුර සඳහා බඳවා ගැනීම - 2015 වර්ෂය*

1. අයදුම්කරුගේ සම්පූර්ණ නම : ———— ;
2. ස්ථිර ලිපිනය : ———— ;
3. ග්‍රාම නිලධාරි වසම හා අංකය : ———— ;
4. උපන් දිනය : අවුරුද්ද : ———— ; මාසය : ———— ; දිනය : ———— ;
5. ඉල්ලුම්පත්‍ර භාරගන්නා අවසාන දිනට වයස : අවු : ———— ; මාස : ———— ; දින : ———— ;
6. ස්ත්‍රී/පුරුෂ භාවය : ———— ;
7. ජාතික හැඳුනුම්පත් අංකය : ———— ;
8. ශ්‍රී ලංකාවේ පුරවැසියකු වන්නේ උපතින් ද, ලියාපදිංචි වීමෙන් ද යන වග : ———— ;
9. අධ්‍යාපන සුදුසුකම් : ———— ; වර්ෂය : ———— ; විභාග අංකය : ———— ;

| *විෂයය* | *සාමාර්ථය* | *විෂයය* | *සාමාර්ථය* |
|---|---|---|---|
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |

10. වෙනත් සුදුසුකම් : ———— ;
11. වෘත්තීය සුදුසුකම් : ———— ;
12. සේවා පළපුරුද්ද : ———— ;
13. දුරකථන අංකය : ———— ;

මෙහි සඳහන් කර ඇති තොරතුරු මාගේ දැනීම හා විශ්වාසය පරිදි සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කරමි. මෙම බඳවා ගැනීමේ කොන්දේසි අනුව මා විසින් සාවද්‍ය තොරතුරු ඉදිරිපත් කර ඇති බව බඳවා ගැනීමට පෙර හෝ පසුව අනාවරණය වුවහොත් කිසිදු වන්දියක් නොගෙවා සේවයෙන් පහ කිරීමට යටත් වන බව මම දනිමි.

.................................,
අයදුම්කරුගේ අත්සන.

දිනය : ..................

දැනටමත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා ආයතන ප්‍රධානියාගේ සහතිකය :

මෙම ඉල්ලුම්කරු වන ...................................... මයා/මිය/මෙනවිය දැනට මෙම දෙපාර්තමේන්තුවේ/ආයතනයේ ................................... වශයෙන් සේවය කරනු ලබයි. ඔහු/ඇය සේවයෙන් නිදහස් කළ හැක/නොහැක. ඔහු/ඇය කුමන ආකාරයේ හෝ විනයානුකූල දඬුවමකට (අවවාද කිරීම් හැර) භාජනය වී නොමැති බව මින් සහතික කරන අතර, අයදුම්පත නිර්දේශ කර ඉදිරිපත් කරමි.

................................
දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියාගේ අත්සන.

දිනය : ..................

04 - 743

## තංගල්ල නගර සභාව

### දකුණු පළාත් රාජ්‍ය සේවයේ පුරප්පාඩු තනතුරු සඳහා බඳවා ගැනීම

තංගල්ල නගර සභාවේ පුරප්පාඩු වී ඇති පහත උපලේඛනයේ සඳහන් තනතුරුවලට බඳවා ගැනීම සඳහා අවම සුදුසුකම් ඇති දකුණු පළාත තුළ ස්ථිර පදිංචිකරුවන්ගෙන් පමණක් අයදුම්පත් කැඳවනු ලැබේ. දැනටමත් තංගල්ල නගර සභාවේ අනියම්, ආදේශක, කොන්ත්‍රාත්, තාවකාලික හා සහන පදනම මත සේවයේ නියුක්ත අයට ප්‍රමුඛතාවයක් දක්වනු ලැබේ.

**උපලේඛනය**

| *තනතුර* | *තනතුරු* | *සංඛ්‍යාව* | *වැටුප් ඛේත අංකය* | *වැටුප් පරිමාණය (මාසික)* | *අධ්‍යාපන හා වෙනත් සුදුසුකම්* |
|---|---|---|---|---|---|
| 01 | පෙදරේරු (III පන්තිය) | 01 | PL 2/2006 A | රු. 12,210-10x130-10x145-10 x160 - 12 x170 රු. 18,600 (හතර වන පියවර එළඹීමට පෙර කාර්යක්ෂමතා කඩඉම) | අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේ දෙවරකට නොවැඩි වාර ගණනක දී විෂයයන් 06ක් සමත්ව තිබිය යුතු ය.<br><br>පෙදරේරු තනතුරට නියමිත පරිදි තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් නිගමනය කරනු ලැබ ඇති පරිදි ජාතික වෘත්තීය කුසලතාවය (N.V.Q) අවම වශයෙන් දෙවැනි මට්ටමේ නිපුණතාවයක් ලබා ගැනීම.<br><br>අදාළ ක්ෂේත්‍රයේ පළපුරුද්ද අමතර සුදුසුකමකි. |
| 02 | සෞඛ්‍ය කම්කරු (III පන්තිය) (ඝණ අපද්‍රව්‍ය මධ්‍යස්ථානය) | 03 | PL 1/2006 A | රු. 11,730-120x10x130x10 x145 - 10 - 160x12 රු. 17,600 | 08 වන ශ්‍රේණිය (09 වසර) සමත්ව තිබීම. 17600 (හතර වන වැටුප් පියවර එළඹීමට පෙර කාර්යක්ෂමතා කඩඉම) |

*අවශ්‍ය අනෙකුත් සුදුසුකම් හා පොදු කොන්දේසි :*

01. රජයේ හෝ රජයේ සංස්ථාවක සේවයේ සිට අකාර්යක්ෂමතාව මත අනිවාර්ය විශ්‍රාම ගන්වා ඇත්තාවූ හෝ සේවයෙන් පහකිරීම වෙනුවට සානුකම්පිත විකල්පයක් ලෙස විශ්‍රාම ගන්වා ඇත්තා වූ හෝ දඬුවමක් වශයෙන් විශ්‍රාම ගන්වා ඇත්තාවූ හෝ විධිමත් විනය පරීක්ෂණයක් මත සේවයෙන් පහකර ඇත්තාවූ හෝ සිය තනතුර අතහැර ගියා වූ හෝ තැනැත්තෙක් නොවිය යුතු ය ;
02. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයට විරුද්ධව සිදුකරන ලද සාපරාධී වරදකට අධිකරණයක් විසින් වරදකරු කරනු ලැබූ තැනැත්තෙක් නොවිය යුතු ය.
03. යම් අපරාධ නීති කෘත්‍යයක දී අධිකරණයක් විසින් වරදකරු කරනු ලැබූ හෝ අපරාධ නඩු විධාන සංග්‍රහයේ 449 වගන්තිය ප්‍රකාරව අධිකරණයක දී ලඝු නඩු විභාගයකින් වරදකරු කරනු ලැබූ තැනැත්තෙක් නොවිය යුතු ය.
04. වස්තු භංගත්වයට පත්වී ඇති තැනැත්තෙකු නොවිය යුතු ය.
05. අයදුම්කරු ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතු ය.
06. යහපත් චරිතයකින් හා මනා ශරීර සෞඛ්‍යයකින් යුක්ත විය යුතු ය.
07. 2015.05.07 දිනට වයස අවු. 18ට නොඅඩු සහ 45ට නොවැඩි විය යුතුයි. (දැනටමත් රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ නියුතු සේවකයින් සඳහා මෙම උපරිම වයස් සීමාව බල නොපැවැත්වේ.).
08. අයදුම්පත් භාරගන්නා අවසාන දිනයට පූර්වාසන්න වසර 03ක කාලයක් තුළ දකුණු පළාත තුළ ස්ථිර පදිංචිකරුවෙකු විය යුතුයි. (පදිංචි වසමේ ග්‍රාම නිලධාරි විසින් නිකුත් කරන ලද පදිංචි සහතිකය ප්‍රාදේශීය ලේකම් විසින් අනුමැතිය තබා පදිංචිය සනාථ කළ හැකි වේ.)
09. මෙම බඳවා ගැනීම අයදුම්පත් කැඳවන අවස්ථාවේ දී හෝ ඊට පසුව හෝ අතරමග දී හෝ අතහැර දැමීමට තංගල්ල නගර සභාවට බලය ඇත.

*විශේෂ සුදුසුකම් :*

01. අයදුම්පත් භාරගන්නා අවසාන දිනයට පූර්වාසන්න වසර 03ක කාලයක් තුළ තංගල්ල නගර සභා බල ප්‍රදේශය තුළ ස්ථිර පදිංචිකරුවෙකු වීම.
02. තනතුරු සඳහා ඉල්ලුම් කරන ඉල්ලුම්කරුවන්ට රියදුරු බලපත්‍රය තිබීම.

03. තනතුරු සඳහා ඉල්ලුම් කරන ඉල්ලුම්කරුවන්ට විදුලි කාර්මික දැනීම තිබීම. ඉලෙක්ට්‍රෝනික යන්ත්‍ර ක්‍රියාකරවීම පිළිබඳ දැනුම, පරිගනක ක්‍රියාකරවීම හෝ දුරකථන පද්ධති අලුත්වැඩියාව පිළිබඳ දැනුම, නීති හා අපදාවලට ප්‍රතිචාර දැක්වීම පිළිබඳ දැනුම, උද්‍යාන අලංකරණය පිළිබඳ දැනුම, කලා කටයුතු පිළිබඳ දැනුම, ෆැක්ස්, ඡායා පිටපත්, මුද්‍රණ යන්ත්‍ර ක්‍රියාකරවීම හා නඩත්තු කිරීම පිළිබඳ දැනුම හෝ වෙනත් විශේෂ දැනුම තිබීම.

04. දැනටමත් තංගල්ල නගර සභාවේ වැටුප් ලබමින් තංගල්ල නගර සභාවේ සේවය කිරීම.

මෙම විශේෂ සුදුසුකම් සම්පූර්ණ කරන අයට ප්‍රමුඛතාව ලබාදෙනු ලැබේ.

*බඳවා ගැනීමේ ක්‍රමය :*

අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයකට භාජනය කර සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් අනතුරුව බඳවා ගැනීම කරනු ලැබේ.

*සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි :*

01. මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. වැන්දඹු/වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් ගෙවිය යුතුය.

02. රජයේ ප්‍රතිපත්තිවලට ද දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව, දකුණු පළාත් සභාව විසින් වරින්වර පනවනු ලබන රීති හා නියෝගවලට ද , ආයතන සංග්‍රහය, මුදල් රෙගුලාසි, රජයේ වෙනත් රෙගුලාසි, චක්‍රලේඛ, උපදෙස්, දෙපාර්තමේන්තු නියෝගවලට ද, ඒවාට අදාලව වරින්වර නිකුත් කරනු ලබන සංශෝධනවලට ද, තංගල්ල නගර සභාව විසින් කරනු ලබන නියෝගවලට ද අනුකූලව ක්‍රියාකිරීමට බැඳී සිටිය යුතුය.

03. රජයේ නිලධාරීන්ගේ ඇප ආඥාපනතට අනුව ඇප තැබිය යුතුය.

04. රජයේ ප්‍රතිපත්තිවලට අදාලව නියම කරනු ලබන භාෂා ප්‍රවීණතාවය ලබාගත යුතුය.

05. බඳවා ගැනීම පිළිබඳ කොන්දේසි අනුව සාවද්‍ය තොරතුරක් දක්වා ඇති බව තහවුරු වුවහොත් පත්වීම අහෝසි කරනු ලැබේ.

06. බඳවා ගනු ලබන සේවකයින් ස්ථාන මාරු කිරීම්වලට යටත්වේ.

07. පත්වීම් අවුරුදු 03ක පරිවාස කාලයකට යටත් වේ. පරිවාස කාලය තුළ වැඩ, පැමිණීම හා හැසිරීම සතුටුදායක නොවන සේවකයින්ගේ සේවය අවසන් කරනු ලැබේ.

*ඉල්ලුම්කළ යුතු ආකාරය :*

මෙම නිවේදනයේ සඳහන් ආදර්ශ ආකෘතිය පරිදි සකස් කරන ලද අයදුම්පත් 2015.05.07 දිනට පෙර ලැබෙනසේ "සභාපති, තංගල්ල නගර සභාව, තංගල්ල" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. එසේ නොමැති නම් තංගල්ල නගර සභාවේ ලේකම් වෙත අතින් භාර දී එය භාරදුන් බව සනාථ කරගත හැකිය. අයදුම්පත් බහාලන කවරයේ ඉහල වම්පස කෙළවරේ "............................................ (තනතුරේ නම) තනතුර සඳහා අයදුම්පත" යනුවෙන් සඳහන් කළ යුතුය.

දැනටමත් රාජ්‍ය/පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් තම අයදුම්පත් සේවා ප්‍රධානියා මගින් එවිය යුතු අතර, නියමිත දිනට පසු ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

අනිල් සෙල්ලාහැන්නදි,
සභාපති,
තංගල්ල නගර සභාව.

***ආදර්ශ අයදුම්පත්‍රය***

*තංගල්ල නගර සභාව*

*දකුණු පළාත් රාජ්‍ය සේවයේ තනතුරු සඳහා බඳවාගැනීම - 2015*

*........................................ තනතුර*

01. *(අ)* මුලකුරු සමග නම : ————— ;
*(ආ)* මුලකුරුවලින් හැඳින්වෙන නම් : ————— ;
02. ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය : ————— ;
03. ස්ථිර පදිංචි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය : ————— ;

04. ස්ථිර ලිපිනය : ———— ;
05. ස්ත්‍රී/පුරුෂ භාවය : ———— ;
06. විවාහක/අවිවාහක බව : ———— ;
07. උපන් දිනය : ———— ;
2015.05.07 දිනට වයස :
අවුරුදු : ———— ; මාස : ———— ; දින : ———— ;
08. ජාතික හැඳුනුම්පත් අංකය : ———— ;
09. ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු වන්නේ උපතින් ද? ලියාපදිංචි වීමෙන් ද? : ———— ;
10. අධ්‍යාපන සුදුසුකම් : ———— ;
11. වෙනත් සුදුසුකම් : ———— ;
12. වෘත්තීය සුදුසුකම් : ———— ;
13. විශේෂ සුදුසුකම් : ———— ;
14. සේවා පළපුරුද්ද :
(i) දැනට සේවය කරන ආයතනය : ———— ;
(ii) දැනට දරන තනතුර : ———— ;
(iii) එම තනතුරට පත්වූ දිනය : ———— ;
(iv) මීට පෙර සේවය කරන ලද ස්ථානය හා දරන ලද තනතුරු : ———— ;

15. අයදුම්කරු සාපරාධී වරදක් සම්බන්ධයෙන් අධිකරණයෙන් වරදකරුවෙකු වී ඇත්ද ?/දඬුවම් ලබා ඇත්ද ? : ———— ;

16. මෙහි සඳහන් කර ඇති තොරතුරු මාගේ දැනීමේ හා විශ්වාසය පරිදි සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කරමි. මෙම බඳවා ගැනීම පිළිබඳව කොන්දේසි අනුව මා විසින් සාවද්‍ය තොරතුරක් දක්වා ඇතොත් මා තෝරාගැනීමෙන් පසුව ඒ බැව් හෙලිවුවහොත් සේවයෙන් පහකිරීමට යටත්වන බව මම දනිමි.

..................................................,
අයදුම්කරුගේ අත්සන.

දිනය : ———— ;

*දැනටමත් රාජ්‍ය/පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා ආයතන ප්‍රධානියාගේ සහතිකය*

මෙම ඉල්ලුම්කරු වන ...................................... මයා./මිය./මෙනවිය දැනට මෙම දෙපාර්තමේන්තුවේ/ ආයතනයේ .............................................. වශයෙන් සේවය කරයි. ඇය/ඔහු සේවයෙන් නිදහස් කළ හැකිය./නොහැකිය. ඔහු/ඇය කුමන ආකාරයේ හෝ විනයානුකූල දඬුවමකට (අවවාද කිරීම් හැර) භාජනය වී නොමැති බව මින් සහතික කරන අතර, අයදුම්පත නිර්දේශ කර/නොකර ඉදිරිපත් කරමි.

.........................................................................................................,
දෙපාර්තමේන්තුවේ/ආයතන ප්‍රධානියාගේ හෝ බලය පවරනු ලැබූ නිලධාරියාගේ අත්සන.

නම : ——————.
පදවි නාමය : ——————.
ආයතනය : ——————.
දිනය : ——————.

04 - 870

---

**දකුණු පළාත් සභාව**

වැලිගම නගර සභාව

වැලිගම නගර සභාවේ පුරප්පාඩු වී ඇති පහත සඳහන් තනතුර සඳහා සුදුසුකම් ඇති අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

| *අනු. අංකය* | *තනතුරු නාමය* | *තනතුරු සංඛ්‍යාව* | *වැටුප් පරිමාණය* | *අධ්‍යාපන සුදුසුකම්* |
|---|---|---|---|---|
| 1. | පුස්තකාල සහායක III ශ්‍රේණිය | 01 | 6/2006 iv PL-1-2006-A | අ.පො.ස. (සා.පෙළ) විභාගයේදී දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙයින් සම්මාන දෙකක් සහිතව විෂයන් හයක් සමත් වී තිබිය යුතුය. (වෛකල්පිත විෂයන් හැර) |

*02. බඳවා ගැනීමේ කොන්දේසි ፡ -*

I. අයදුම්කරු පරම්පරාවෙන් හෝ ලියාපදිංචියෙන් ශ්‍රී ලාංකික පුද්ගලයකු විය යුතු ය.
II. අයදුම්පත් කැඳවන දිනට පූර්වාසන්න වසර 05ක කාලයක් වැලිගම නගර සභා බලප්‍රදේශයේ ස්ථිර පදිංචි අයෙකු විය යුතුය.
III. අයදුම්පත් කැඳවන දිනට වයස අවුරුදු 18ට නොඅඩු සහ අවුරුදු 45ට නොවැඩි විය යුතු ය.
IV. ඉහත තනතුරට අදාළ සුදුසුකම් සපුරා තිබිය යුතු ය.
V. බඳවා ගැනීම පරිපාටිය අනුව විධිමත් සම්මුඛ පරීක්ෂණයකට යොමු කරනු ලබන අතර එහිදී ලබාගනු ලබන ඉහළම ලකුණු අනුව සුදුසු අයෙකු තෝරාගැනේ.
VI. අයදුම්පත් කැඳවීමෙන් අනතුරුව හෝ අයදුම්පත් කැඳවන අතරතුර බඳවා ගැනීම් ප්‍රමාද කිරීම හෝ වෙනස් කිරීම හෝ මෙම නිවේදනය සංශෝධනය කිරීම හෝ අවලංගු කිරීම වැලිගම නගර සභාව සතුවේ.
VII. දැනටමත් වැලිගම නගර සභාවේ මෙම තනතුරෙහි ආදේශක/අනියම්/තාවකාලික පදනම මත සේවය කරන සේවකයින් සඳහා ප්‍රමුඛතාවය ලබාදෙනු ලබන අතර ඒ පිළිබඳ තීරණ ගැනීම සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය සතුවේ.

*03. බඳවා ගැනීමේ ක්‍රමය :*

නියමිත සුදුසුකම් සපුරා ඇති අය පමණක් සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ.

*04 සේවයේ නියුක්ත කරලීමේ කොන්දේසි .-*

I. මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිත වේ.
II. අදාළ පරිදි වැන්දඹු අනත්දරු, වැන්දඹු පුරුෂ විශ්‍රාම වැටුප් අරමුදලට දායකවිය යුතු ය.
III. බඳවාගනු ලබන තැනැත්තා තුන් අවුරුදු පරිවාස කාලයකට යටත්වේ. එම කාලය තුළදී වැඩ, පැමිණීම හා හැසිරීම සතුටුදායක වේනම් පරිවාස කාලය අවසානයේ සේවයේ ස්ථිර කරනු ලැබේ.
IV. බඳවා ගැනීමේ කොන්දේසි හා රෙගුලාසිවලට අනුව ආයතන සංග්‍රහයේ විධිවිධානවලට ද, දකුණු පළාත් රාජ්‍ය සේවයේ මුදල් රෙගුලාසිවලට හා දෙපාර්තමේන්තු නියෝගවලටද වැලිගම නගර සභාව විසින් වරින්වර නිකුත් කරනු ලබන රෙගුලාසි හා නියෝගවලට අනුකූලව කටයුතු කිරීමට බැඳී සිටිය යුතු ය.
V. විශිෂ්ඨ චරිතයකින් හා මනා සෞඛ්‍ය තත්වයකින් යුක්ත විය යුතු ය. තෝරාගනු ලැබුවහොත් මසක් ඇතුළත රජයේ වෛද්‍යවරයෙකු විසින් පවත්වනු ලබන වෛද්‍ය පරීක්ෂණයට පෙනී සිටිය යුතු අතර එම පරීක්ෂණයෙන් ශාරීරික වශයෙන් නුසුදුසු බව පෙනී ගියහොත් පත්වීම අවලංගු කරනු ලැබේ.
VI. දණ්ඩනීති සංග්‍රහය යටතේ උසාවියකින් වරදකරු වී දඬුවම් ලැබූවකු නොවිය යුතු ය.

*05. අයදුම්පත් ඉදිරිපත් කළ යුතු ආකාරය :*

මෙම නිවේදනයේ අවසානයේ දක්වා ඇති ආදර්ශ ආකෘතිය අනුව A 4 ප්‍රමාණයේ කඩදාසියක දෙපැත්ත භාවිතා කිරීමෙන් අයදුම්පත් පිළියෙළ කළ ඉදිරිපත් කළ යුතුය. අයදුම්පත් බහාලන කවරයේ ඉදිරිපස ඉහළ කෙළවරයේ ඉල්ලුම් කරන තනතුර සඳහන් කර 2015.04.30 දිනට හෝ එදිනට පෙර ලැබෙන සේ ලේකම්/සභාපති, වැලිගම නගර සභාව යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් ලැබෙන සේ ඉදිරිපත් කළ යුතුය. තැපෑලේ දී නැතිවන හෝ ලිපිනය වැරදි ලෙස ලියා ආපසු හරවා යැවුණු හෝ නියමිත දිනට පසුව ලැබෙන අයදුම්පත් සම්බන්ධයෙන් වගකියනු නොලැබේ.

*06. අයදුම්පත් සමග පහත ලියවිලි සහතික පිටපත් එවිය යුතුය :*

* උප්පැන්න සහතිකය ;
* ජාතික හැඳුනුම්පත ;
* අධ්‍යාපන සහතික ;
* ප්‍රාදේශීය ලේකම් විසින් අනුඅත්සන් කළ ස්ථිර පදිංචිය ඇති කොට්ඨාසයේ ග්‍රාම නිලධාරි විසින් නිකුත් කල පදිංචිය පිළිබඳ සහතිකය ;
* වෘත්තීය සුදුසුකම් දැක්වෙන සහතික ;
* සේවා පළපුරුද්ද පිළිබඳ සහතික ;
* මෑතක දී ලබාගත් චරිත සහතිකයක්.

සභාපති,
වැලිගම නගර සභාව.

2015 මාර්තු මස 30 වැනි දින,
වැලිගම නගර සභා කාර්යාලයේ දී ය.

**ආදර්ශ අයදුම්පත්‍රය**

*වැලිගම නගර සභාව*

*පුරප්පාඩු පිරවීම - වැලිගම නගර සභාව*

...........................................තනතුර සඳහා වන ආදර්ශ අයදුම්පත්‍රය

01. මුලකුරු සමග නම : ———— ;
1.1 මුලකුරුවලින් හැඳින්වෙන නම් : ———— ;

02. ස්ථිර ලිපිනය : ———— ;
03. උපන් දිනය : අවු. : ———— ; මාසය : ———— ; දිනය : ———— ;
04. අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස : අවු : ———— ; මාස : ———— ; දින : ———— ;
05. ජාතිය : ———— ;
06. ඔබ ශ්‍රී ලංකා පුරවැසියෙක් ද ? : ———— ;
එසේ නම් පරම්පරාවෙන් ද/ලියාපදිංචි වීමෙන්ද යන වග : ———— ;

07. අධ්‍යාපන සුදුසුකම් (අ.පො.ස.) සා.පෙළ : ———— ;
සමත් වර්ෂය : ———— ; විභාග අංකය : ———— ;

| *විෂයය* | *සාමාර්ථය* | *විෂයය* | *සාමාර්ථය* |
|---|---|---|---|
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |

08. (1) වෙනත් සුදුසුකම් : ———— ;
(2) වෘත්තීය සුදුසුකම් : ———— ;
(3) සේවා පළපුරුද්ද : ———— ;
(4) සියලුම අධ්‍යාපන හා වෙනත් සුදුසුකම් සනාථ කිරීමට අදාළ සහතිකවල පිටපත්, අයදුම්පත්‍රය සමග අමුණා එවිය යුතු ය.

09. ඔබ කවරදාක හෝ චෝදනාවක් සඳහා උසාවියකින් වරදකරු වී තිබේ ද? : ———— ;

මෙම අයදුම්පත්‍රයේ මා විසින් සපයන ලද තොරතුරු මා දන්නා තරමින් සත්‍ය හා නිවැරදි බව සහතික කරමි.

මෙහි ඇතුළත් ඉහත සඳහන් තොරතුරු අසත්‍ය බව ඔප්පු වුවහොත් සේවයට බඳවා ගැනීමට පෙර නුසුදුස්සෙක් වන බව හා පත්වීම් ලැබීමෙන් පසු එවැනි කරුණක් ඔප්පු වීමෙන් පසු කිසිදු වන්දියක් නොගෙවා සේවයෙන් පහකරනු ලැබීමට යටත් වන බව මම දනිමි.

................................,
අයදුම්කරුගේ අත්සන.

දිනය : .................

ආයතන ප්‍රධානියාගේ සහතිකය ඃ

මෙම ඉල්ලුම්කරු/ඉල්ලුම්කාරිය වන ...................................... මයා/මිය/මෙනවිය මෙම ආයතනයේ ස්ථිර/අනියම්/ආදේශක පදනම මත ................................... වශයෙන් සේවය කරන බව සහතික කරමි.

................................
ආයතන ප්‍රධානියාගේ අත්සන.

අත්සන : .................
නම : .................
පදවිය : .................
දිනය : .................

04 - 716

**බියගම ප්‍රාදේශීය සභාව**

තනතුරු පුරප්පාඩු

බියගම ප්‍රාදේශීය සභාවේ සෞඛ්‍ය පරිපාලක තනතුර සඳහා බඳවා ගැනීමට සුදුසුකම් ඇති අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

***සීමිත බඳවා ගැනීම :***

| *තනතුරු නාමය* | *තනතුරු සංඛ්‍යාව* | *වැටුප් පරිමාණය* | *අධ්‍යාපන හා වෙනත් සුදුසුකම්* |
|---|---|---|---|
| සෞඛ්‍ය පරිපාලක III ශ්‍රේණිය | 01 | MN1-2006A<br>රු. 13,120 - 10 x 145<br>11 x 170 - 10 x 240 - 10 x 320<br>රු. 22,040 | අ.පො.ස (සාමාන්‍ය පෙළ) විභාගයෙන් දෙවරකට නොවැඩි වාර ගණනක දී භාෂාවට සහ ගණිතයට සම්මාන දෙකක් සහිතව විෂයන් 06 කින් සාමාර්ථ ලබා තිබීම. (මින් විෂයයන් පහක් (5) එකවර සමත් වී තිබිය යුතුයි.) |
| පළපුරුද්ද | | | පළාත් පාලන ආයතනයක PL-1 හා P1-2 වැටුප් කේත අංක යටතේ වැටුප් ලබන, සේවය ස්ථිර කර ඇති හා ස්ථිර සේවා කාලය වසර පහ (05) ක් සපුරා ඇති සේවකයින් විය යුතු අතර සේවා කාලය ආයතන ප්‍රධානියා ලිඛිතව සනාථ කළ යුතු ය. |
| කායික සුදුසුකම් | | | තනතුරේ රාජකාරි ඉටු කිරීමට ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතු ය. |
| වෙනත් | | | ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතු ය. අයදුම්පත් කැඳවන දිනට පූර්වාසන්න වසර 03 ක් අඛණ්ඩව බස්නාහිර පළාතේ ස්ථිර පදිංචිකරුවකු විය යුතු ය. |
| වයස | | අවම සීමාව<br>උපරිම සිමාව | දැනටමත් පළාත් රාජ්‍ය සේවයේ නියුතු වූවන්ට මෙම වයස් සීමාවන් අදාළ නොවේ. |
| බඳවා ගැනීමේ ක්‍රමය | | ලිඛිත විභාගය | |

| *විෂයයන්* | *උපරිම ලකුණු ප්‍රමාණය* | *සමත් ලකුණු ප්‍රමාණය* |
|---|---|---|
| සාමාන්‍ය දැනීම හා බුද්ධි පරීක්ෂණය | 100 | 40% |
| ක්ෂේත්‍රයට අදාළ දැනුම පරීක්ෂා කිරීමේ පරීක්ෂණයක් | 100 | 40% |

***විවෘත බඳවා ගැනීම :***

| *තනතුරු නාමය* | *තනතුරු සංඛ්‍යාව* | *වැටුප් පරිමාණය* | *අධ්‍යාපන හා වෙනත් සුදුසුකම්* |
|---|---|---|---|
| සෞඛ්‍ය පරිපාලක III ශ්‍රේණිය | 01 | MN1-2006A<br>රු. 13,120 - 10 x 145<br>11 x 170 - 10 x 240 - 10 x 320<br>රු. 22,040 | සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව ගණිතය සහ තවත් විෂයයන් දෙකකට සම්මාන සාමාර්ථයක් සහිතව එකවර විෂයයන් (06) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත් වී තිබීම සහ අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේ දී අවම වශයෙන් විෂයයන් එකක්වත් (01) (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) සමත්ව තිබීම. |
| කායික සුදුසුකම් | | | *කායික සුදුසුකම් :*<br>තනතුරේ රාජකාරි ඉටු කිරීමට ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය. |
| වෙනත් | | | ශ්‍රී ලංකාවේ පුරවැසියකු විය යුතු ය.<br>අයදුම්පත් කැඳවන දිනට පූර්වාසන්න වසර 03 ක් අඛණ්ඩව බස්නාහිර පළාතේ ස්ථිර පදිංචිකරුවකු විය යුතු ය.<br>විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතු ය. |

| *තනතුරු නාමය* | *තනතුරු සංඛ්‍යාව* | *වැටුප් පරිමාණය* | *වෙනත් සුදුසුකම්* |
|---|---|---|---|
| වයස | | අවම සීමාව | අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස අවුරුදු 18 ට නොඅඩු විය යුතුය. |
| | | උපරිම සීමාව | අවුරුදු 30 නොවැඩි විය යුතුය. |
| බඳවා ගැනීමේ ක්‍රමය | | ලිඛිත විභාගය | |

| *විෂයයන්* | *උපරිම ලකුණු ප්‍රමාණය* | *සමත් ලකුණු ප්‍රමාණය* |
|---|---|---|
| අභියෝග්‍යතාව හා බුද්ධි පරීක්‍ෂණය | 100 | 40% |
| කාලීන සිදුවීම් පිළිබඳ සාමාන්‍ය අවබෝධය | 100 | 40% |

**බියගම ප්‍රාදේශීය සභාවේ කළමනාකරණ සහකාර තාක්ෂණික නොවන බණ්ඩ 2 සේවා ගණයේ ආදායම් පරීක්ෂක තනතුරු සඳහා බඳවා ගැනීමට සුදුසුකම් ඇති අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.**

**විවෘත බඳවා ගැනීම :**

| *තනතුරු නාමය* | *තනතුරු සංඛ්‍යාව* | *වැටුප් පරිමාණය* | *අධ්‍යාපන හා වෙනත් සුදුසුකම්* |
|---|---|---|---|
| 01. ආදායම් පරීක්ෂක III පංතිය | 04 | වැටුප් කේත අංකය MN1-2006A<br>වැටුප් පරිමාණය රු. 13,120 - 10 x 145 - 11 x 170 - 10 x 240 - 10 x 320 - රු.220,400<br>ආරම්භක වැටුප් පියවර රු. 13,120. | i. සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව, ගණිතය සහ තවත් විෂයයන් හයකින් (06) අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත්ව තිබීම ; සහ<br>ii. අධ්‍යාපන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේදී අවම වශයෙන් විෂයයන් එකක්වත් (01) (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) සමත්ව තිබීම.<br><br>*කායික සුදුසුකම් :*<br><br>තනතුරේ රාජකාරි ඉටුකිරීමට ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.<br><br>*වෙනත් සුදුසුකම් :*<br><br>i. ශ්‍රී ලංකා පුරවැසියෙකු විය යුතුය.<br>ii. අයදුම්පත් කැඳවන දිනට පූර්වාසන්න වසර 03 ක් අඛණ්ඩව බස්නාහිර පළාතේ ස්ථිර පදිංචිකරුවෙකු විය යුතුය.<br>iii. යහපත් චරිතයකින් යුක්ත විය යුතුය.<br>iv. තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියලුම සුදුසුකම් සම්පූර්ණ කර තිබිය යුතු බවට අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ/ගැසට් පත්‍රයේ සඳහන් කරනු ලබන දිනට එම සුදුසුකම් සෑම ආකාරයෙන්ම සපුරා තිබිය යුතුය.<br><br>*වයස* .- අවම සීමාව අවු 18 ට නොඅඩු විය යුතුය. අවු 30 ට නොවැඩි විය යුතුය. |

*බඳවා ගැනීමේ ක්‍රමය :*

ලිඛිත විභාගය

| *විෂයයන්* | *උපරිම ලකුණු ප්‍රමාණය* | *සමත් ලකුණු ප්‍රමාණය* |
|---|---|---|
| අභියෝග්‍යතාව හා බුද්ධි පරීක්ෂණය | 100 | 40% |
| සාමාන්‍ය දැනීම | 100 | 40% |

සටහන : ලිඛිත පරීක්ෂණයේදී අයදුම්කරුවන් ලකුණු ලබා ගන්නා කුසලතා අනුපිළිවෙල අනුව පුරප්පාඩු පුරවනු ලැබේ.

*පොදු සුදුසුකම් :*

i. අයදුම්කරු ශ්‍රී ලාංකිකයෙක් විය යුතුය.
ii. අයදුම්පත් භාර ගන්නා දිනය පූර්ව වසර 03 ක කාලයක් බස්නාහිර පළාත තුළ ස්ථිර පදිංචිකරුවෙකු විය යුතුය.
iii. යහපත් චරිතයකින් සහ මනා ශරීර සෞඛ්‍යයකින් යුක්ත විය යුතුය.
iv. අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස අවුරුදු 18 නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.
v. එහෙත් දැනටමත් (රාජ්‍ය/පළාත් රාජ්‍ය සේවයේ නියුතු ස්ථිර සේවකයින් සඳහා මෙම උපරිම වයස් සීමාව බල නොපැවැත්වේ.)
iv. දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියක වරදකරු වී ඇති දඬුවම් ලැබූවෙකු නොවිය යුතුය.

03. ස්ථිර සේවකයෙකු සඳහා බඳවා ගන්නා ක්‍රමය රාජ්‍ය පරිපාලක චක්‍රලේඛ 24/95 විධිවිධාන අනුව සිදු කෙරේ.

ඉහත සඳහන් සියළුම තනතුරු සඳහා බඳවා ගැනීම් බියගම ප්‍රාදේශීය සභාවේ ලේකම් විසින් සිදු කරනු ලැබේ.

04. *සේවයේ නියුතු කරවීමේ කොන්දේසි :*

(i) මෙම තනතුර ස්ථිරය, විශ්‍රාම වැටුප් සහිතයි. වැන්දඹු අනත්දරු/වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් ගෙවිය යුතුවේ.
(ii) බඳවා ගනු ලබන සේවකයින් තුන් අවුරුදු පරිවාස කාලයකට යටත් වන අතර උසස් කරනු ලබන සේවකයින් එක් අවුරුදු වැඩ පරීක්ෂණ කාල සීමාවකට යටත් වේ.
(iii) මෙම බඳවා ගැනීමේ කොන්දේසිවලට අමතරව ආයතන සංග්‍රහයේ කොන්දේසිවලටද, බස්නාහිර පළාත් සභාවේ මුදල් රෙගුලාසි වලටද, ගරු ආණ්ඩුකාරතුමාගේ නියෝගවලටද, බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව කලින් කලට පනවනු ලබන වෙනත් කොන්දේසි හෝ රෙගුලාසිවලටද පළාත් පාලන ආයතනයට අදාල ආඥාපනත්/පනත්වල විධිවිධානවලටද බියගම ප්‍රාදේශීය සභාව විසින් වරින් වරට නිකුත් කරන ලද/ලබන නියෝගවලටද අනුකූලව කටයුතු කිරීමට එකඟ විය යුතුය.

05. *ඉල්ලුම් කළ යුතු ආකාරය :*

මෙම නිවේදනයේ සඳහන් ආදර්ශ ආකෘතිය අනුව "12 x 8" ප්‍රමාණයේ කඩදාසියක සකස් කරන ලද අයදුම්පත අයදුම්පත් භාර ගන්නා අවසන් දින වන 2015.05.15 දිනට පෙර "ලේකම්, බියගම ප්‍රාදේශීය සභාව, දෙල්ගොඩ" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත් බහාලන කවරයේ වම් ඉහල කෙලවරේ "ඉල්ලුම් කරන තනතුර සඳහා අයදුම්පත්" යනුවෙන් සඳහන් කළ යුතුය. (දැනටමත් රාජ්‍ය/පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් තම ඉල්ලුම්පත් තම සේවා ප්‍රධානියා මගින් එවිය යුතුය) නියමිත දිනට පසුව ලැබෙන ඉල්ලුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

අයදුම්පත සමඟ පහත සහතිකවල පිටපත් ඇමිණිය යුතු අතර මුල් පිටපත් සම්මුඛ පරීක්ෂණයේදී ඉදිරිපත් කළ යුතුය.

i. උප්පැන්න සහතිකය
ii. අධ්‍යාපන සහතික
iii. පදිංචිය සහතික කිරීම පිණිස මෑතකදී ලබාගත් ග්‍රාම නිලධාරී සහතිකය (ප්‍රාදේශීය ලේකම් අනු අත්සන් කර තිබිය යුතුය)
iv. මෑතකදී ලබාගත් චරිත සහතික 02 ක්
v. පළපුරුද්ද පිළිබඳ සහතික
vi. .අනන්‍යතාවය තහවුරු කිරීම සඳහා ජාතික හැඳුනුම්පතේ පිටපතක්

*සැ. යු.-* මෙම ගැසට් නිවේදනය සංශෝධනය කිරීම හෝ කල් දැමීම හෝ අවලංගු කිරීම යන සියළු බලතල බියගම ප්‍රාදේශීය සභාවේ ලේකම්වරිය සතු වේ.

වසන්ති වික්‍රමරත්න,
ලේකම් (වැ. බ),
බියගම ප්‍රාදේශීය සභාව.

2015 අප්‍රේල් මස 09 වැනි දින,
බියගම ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

*අයදුම්පත්‍රය*

................................ *තනතුර සඳහා අයදුම්පත්‍රය*

01. අයදුම්කරුගේ නම (මුලකුරු සමග නම) : ————— ;
02 මුලකුරුවලින් හැඳින්වෙන නම් : ————— ;
03. තැපැල් ලිපිනය : ————— ;
04. දුරකථන අංකය
05. උපන් දිනය : ————— ;
වර්ෂය : ————— ; මාසය : ————— ; දිනය : ————— ;
06. ජාතික හැඳුනුම්පත් අංකය : ————— ;
07. 2015.05.15 වැනි දිනට වයස : ————— ;
අවුරුදු : ————— ; මාස : ————— ; දින : ————— ;

08. ස්ත්‍රී/පුරුෂ භාවය : ————— ;
09. විවාහක/අවිවාහක බව : ————— ;
10. ජාතිය : ————— ;
11. ඔබ ශ්‍රී ලංකා පුරවැසියෙක්ද? එසේ නම් පරම්පරාවෙන්ද? ලියාපදිංචි වීමෙන්ද යන වග : ————— ;
12 අධ්‍යාපන සුදුසුකම් : ————— ;
13. පළපුරුද්ද හා වෘත්තීය සුදුසුකම් : ————— ;
14 ඔබ දැනටමත් බියගම ප්‍රාදේශීය සභාවේ සේවය කරන්නේ නම්

(i) දැනට දරන තනතුර : ————— ;
(ii) එම තනතුරට පත් වූ දිනය : ————— ;
(iii) එම පත්වීමේ ස්වභාවය (ස්ථිර/අනියම්/තාවකාලික/ආදේශක/කොන්ත්‍රාත්/ව්‍යාපෘති පදනම මතද) : ————— ;

මෙම අයදුම්පතෙහි මා විසින් සපයන ලද තොරතුරු සත්‍යවූත් හා නිවැරදිවූත් ඒවා බව මම මෙයින් සහතික කරමි. මෙහි ඇතුළත් තොරතුරු කිසිවක් අසත්‍ය හෝ වැරදි බව මෙම තනතුරට තෝරා ගැනීමට පෙර අනාවරණය වුවහොත් මා නුසුදුස්සෙකු වන බවත් පත්වීම ලැබීමෙන් පසුව එවැනි කරුණක් ඔප්පු වුවහොත් කිසිදු වන්දියක් නොගෙවා සේවයෙන් පහකරනු ලැබීමට යටත් වන බවත් දනිමි.

.................................................
අයදුම්කරුගේ අත්සන.

දිනය :................................

04 - 841

## පළාත් පාලන නිවේදන

### දෙහිඕවිට ප්‍රාදේශීය සභාව

ගෝ ඝාතක ආඥාපනත (272 වැනි අධිකාරය)

අවිස්සාවේල්ල, නාපාවල එම්. එම්. එම්. අවුෆ් නමැති අය අවිස්සාවේල්ල, නාපාවල එම්. එස්. එම්. ඉරුපාන් නැමැති අයට අයත් සබරගමුව පළාතේ කැගල්ල දිස්ත්‍රික්කයේ අටුළුගම කෝරළේ නාපාවල ගමේ පිහිටි ගොඩෝවිට නැමැති ඉඩමේ 2015.12.31 දින දක්වා ගෝ ඝාතකාගාරයක් ඉදිකිරීමට අවසර ඉල්ලා ඇත.

මේ සම්බන්ධයෙන් දෙහිඕවිට ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පදිංචි යම් අයෙක් විරුද්ධ වන්නේ නම් ඔහු/ඇය විරුද්ධ වීමට හේතු වූ කරුණු පිටපත් දෙකකින් යුතුව මෙම දැන්වීමේ සඳහන් දින සිට දින 14ක් ඇතුළත ලේඛනගත තැපෑලෙන් මා වෙත දැන්විය යුතු බව ගෝ ඝාතක පනතේ (272 වැනි අධිකාරය) 7 (2) වගන්තිය ප්‍රකාර මෙයින් දැනුම් දෙනු ලැබේ.

කේ. ඒ. අයි. අමිල රුවන් කන්දෙආරච්චි,
සභාපති,
දෙහිඕවිට ප්‍රාදේශීය සභාව,
දෙහිඕවිට.

2015 ක්වූ මාර්තු මස 31 වැනි දින,
දෙහිඕවිට ප්‍රාදේශීය සභාවේ දී ය.

04 - 804

### දෙවිනුවර ප්‍රාදේශීය සභාව

261 වන අධිකාරය වන 1952 අංක 6 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 3 වැනි වගන්තියේ (1) උප වගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාර දෙවිනුවර ප්‍රාදේශීය සභාව විසින් 2015.01.23 දින පවත්වන ලද සභා රැස්වීමේදී පහත උප ලේඛනයේ සඳහන් අංක ඉ.1 දරන යෝජනාව සම්මත කරන ලද බව මහජනයා වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

සභාපති,
දෙවිනුවර ප්‍රාදේශීය සභාව,

2015 ක්වූ මාර්තු මස 27 වැනි දින,
දෙවිනුවර ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

**උපලේඛනය**

1989 අංක 12 දරන පළාත් සභා (ආනුශාංගික විධිවිධාන) පනතේ 2 වැනි වගන්තියේ (1) වන උප වගන්තියේ (අ) ඡේදය සමග කියවිය යුතු, 261 වන අධිකාරය වන 1952 අංක 6 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 2 වැනි වගන්තියේ (1) වන උප වගන්තිය යටතේ පැවරී ඇති බලතල ප්‍රකාර දකුණු පළාතේ පළාත් සභාවේ පළාත් පාලන විෂයභාර අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2013.05.17 දින අංක 1811 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* පළ කරන ලද්දා වූද, දකුණු පළාතේ පළාත් සභාව විසින් අනුමත කරන ලද බව 2014.08.29 දින අංක 1878 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* පළ කරන ලද නිවේදනයෙන් ප්‍රකාශයට පත්කරන ලද්දා වූ ද, සම්මත අතුරු ව්‍යවස්ථාවල I සිට XXIX දක්වා වූ කාණ්ඩ, මේ යෝජනාව *ගැසට් පත්‍රයේ* පළ කරනු ලබන දින සිට පිළිගෙන ක්‍රියාත්මක කිරීමට, ඉහත කී පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 3 වැනි වගන්තියේ (1) වන උප වගන්තිය යටතේ දෙවිනුවර ප්‍රාදේශීය සභාව මෙයින් යෝජනා කරන්නී ය.

04 - 721

---

**කොළොන්න ප්‍රාදේශීය සභාව**

මාර්ග නම් කිරීම

සබරගමුව පළාතේ රත්නපුර දිස්ත්‍රික්කයේ කොලොන්න ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ කැල්ල ග්‍රාම නිලධාරී වසමේ කැල්ල විද්‍යාලය අසළින් ආරම්භ වී සපුගහලදුගොඩ හරහා කැල්ල ශ්‍රී සුදර්ශණ විහාරස්ථානය දක්වා වූ 1.5Km පමණ මාර්ග කොටස "අමරකෝන් රාළහාමි මාවත" ලෙස නම් කිරීම සඳහා ගරු සබරගමුව පළාත් ප්‍රධාන අමාත්‍ය මහීපාල හේරත් මැතිතුමා විසින් අනුමත කර ඇති බවත්, ඒ අනුව 2015.04.01 දිනයේ සිට ඉහත නම් කර ඇති මාර්ග කොටස "අමරකෝන් රාළහාමි මාවත'' ලෙස නම් කිරීම සුදුසු බවත් කොලොන්න ප්‍රාදේශීය සභාව විසින් තීරණය කර ඇති බව පොදු මහජනතාවගේ දැනගැනීම සඳහා මෙයින් ප්‍රකාශයට පත් කරමි.

පී. එච්. ආර්. ඩී. දයාපතිරණ,
සභාපති,
කොලොන්න ප්‍රාදේශීය සභාව,
කොලොන්න.

2015 ක්වූ පෙබරවාරි මස 18 වැනි දින,
කොලොන්න ප්‍රාදේශීය සභාව,
කොලොන්න.

04 - 803

---

ඇමුණුම : 01

**ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාව**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24 වැනි වගන්තිය යටතේ කරනු ලබන දැන්වීමයි

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24 වැනි වගන්තිය ප්‍රකාර, සබරගමුව පළාත් සභාවේ රත්නපුර දිස්ත්‍රික්කයේ ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාව විසින් මෙහි පහත උපලේඛනයේ දක්වා ඇති මංමාවත් ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාව සතු මංමාවත් වශයෙන් ප්‍රකාශයට පත්කරනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

මේ පිළිබඳව ප්‍රදේශයේ පොදු ජනතාව විසින් හෝ මංමාවත්වලට අදාළ ඉඩම් අයිතිකරුවන් ලෙස හිමිකම් පාන පාර්ශවයන් විසින් යම් විරුද්ධතාවයන් පළකරනු ලබන්නේ නම් මෙම නිවේදනය *ගැසට් පත්‍රයේ* පළ වූ දිනයේ සිට එක් මසක් ඇතුළත තමන්ගේ අයිතිය ඔප්පු කිරීම සඳහා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24(2) වැනි වගන්තිය ප්‍රකාර ක්‍රියා කරන ලෙස මෙයින් දැනුම් දෙනු ලැබේ.

මෙම නිවේදනයේ සඳහන් නියමිත කාල සීමාව තුළ යම් විරුද්ධතාවයක් ඉදිරිපත් නොවුවහොත් උපලේඛනයේ සඳහන් මංමාවත් ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාව සතු මංමාවත් වශයෙන් පිළිගෙන පාලනය කරනු ලබන බැව් පොදු ජනතාවගේ දැනගැනීම සඳහා මෙයින් ප්‍රකාශයට පත් කරමි.

ඒ. ඩී. සරත් සන්දනායක
සභාපති,
ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාව.

2015 අප්‍රේල් මස 01 වැනි දින,
ප්‍රාදේශීය සභාව,
ඇහැලියගොඩ.

ඇමුණුම 02

**උපලේඛන 01**

| | *මාර්ගයේ නම* | *ආරම්භක ස්ථානය* | *අවසාන ස්ථානය* | *බිම් ප්‍රමාණය* | *පළල* | *බලයලත් මිනින්දෝරු තැන/පිඹුරුපත් අංකය* |
|---|---|---|---|---|---|---|
| 1. | ගැටහැත්ත උඩුවක පාරේ සිට කැටමිරිස්පිටිය වත්ත හරහා ගැටහැත්ත උඩුවක දක්වා ගමන් ගන්නා මාර්ගය | ගැටහැත්ත-උඩුවක මාර්ගයේ ඩම්. එම්. පොඩි නිලමෙට අයත් කනත්තෙ වත්ත ඉඩම අසලින් ආරම්භ වී | ගැටහැත්ත-උඩුවක මාර්ගයේ ආර්. පී. කරුණාරත්න සහ තවත් අය භුක්ති විඳින මල් පැත්ත හා ලිඳගාව වත්ත දක්වා | හෙක්ටයාර් 0.1089 (අක්කර 00 රූඩ් 01) පර්චස් 03.03) | 4.8 මීටර් | අ. වෙලගෙදර බලයලත් මිනින්දෝරු විසින් මැන සකස් කරන ලද පිඹුරු පත් අංක 3016 දරන පිඹුර |

04 - 715

---

## උඩුනුවර ප්‍රාදේශීය සභාව

### 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24 (01) වැනි වගන්තිය යටතේ කරනු ලබන දැන්වීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24 (01) වගන්තිය ප්‍රකාරව මධ්‍යම පළාතේ මහනුවර දිස්ත්‍රික්කයේ උඩුනුවර ප්‍රාදේශීය සභාව විසින් මෙහි පහත සඳහන් උපලේඛනයේ දක්වා ඇති මංමාවත් උඩුනුවර ප්‍රාදේශීය සභාව සතු මංමාවත් වශයෙන් ප්‍රකාශයට පත්කරනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ. මේ පිළිබඳව ප්‍රදේශයේ පොදු ජනතාව විසින් හෝ මංමාවත් වලට අදාළ ඉඩම්වල හිමිකරුවන් ලෙස හිමිකම්පාන පාර්ශවයන් හෝ යම් විරෝධතාවයක් පළ කරන්නේ නම් මෙම නිවේදනය *ගැසට් පත්‍රයේ* පළ වූ දිනයේ සිට එක් මාසයක් ඇතුළත් තමන්ගේ අයිතිය ඔප්පු කිරීම සඳහා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24 (11) වැනි වගන්තිය ප්‍රකාරව ක්‍රියා කරන ලෙස මින් දැනුම් දෙනු ලැබේ. එසේ එවන ලිපි ලියා පදිංචි තැපෑලනේ එවිය යුතු ය.

මෙම කාල සීමාව තුළ මෙම නිවේදනය පිළිබඳව යම් විරෝධතාවයක් නොවුනහොත් උපලේඛනයේ සඳහන් මංමාවත් උඩුනුවර ප්‍රාදේශීය සභාව සතු මංමාවත් වශයෙන් පිළිගෙන පාලනය කරනු ලබන බව පොදු ජනතාවගේ දැනගැනීම සඳහා මෙයින් ප්‍රකාශයට පත් කරමි.

ආර්. එම්. බන්දුල සෙනවිරත්න,
සභාපති,
උඩුනුවර ප්‍රාදේශීය සභාව,
ගෙලිඔය.

**උපලේඛනය**

| *අනු. අංකය* | *මාර්ගයේ නම* | *ආරම්භය* | *අවසානය* | *වම් පස පදිංචිකරුවන්* | *දකුණු පස පදිංචිකරුවන්* | *දිග (අඩි)* | *පළල (අඩි)* |
|---|---|---|---|---|---|---|---|
| 01 | මීරන්දෙණිය සිට කුරුගල් වත්ත හරහා ඇට්ලෝනවත්ත මාර්ගය | මීරන්දෙණිය | කුරගල්වත්ත | ඩී. ඇම්. පී. දසනායක මැණිකේ<br>කුමුදුනී දිසානායක<br>ඩී. එම්. ජයතිලක බණ්ඩාර<br>ඩී. එම්. තිලකවංශ | | 517 | 10 |
| 02 | කන්දෙවත්ත් පාර | කන්දෙවත්ත | කුරුඅඹේවත්ත | එල්.ආර්. ඩී. පර්සි පෙරේරා<br>කේ. එච්. මිත්‍රානන්ද ධර්මසිරි<br>එච්. ඊ. එම්. ආර්. ඩී. එච්. ඒකනායක<br>ඩී. එම්. අබේරත්න දිසානායක | එස්. එච්. එම්. නිස්සංක බංඩාර<br>එච්. එම්. ගාමිණී බණ්ඩාර<br>එච්. එම්. කරුණාරත්න බණ්ඩා<br>එච්. එම්. තිස්ස බණ්ඩාර | 1148 | 12 |
| 03 | කරමඩ දකුණ කොහිල අංගහේන පාර | වේළුවනාරාම පාරේ සිට දකුණට | කොහිලඅංග උඩහේන | එස්. එම්.රත්නකලා | කේ. ඒ. එස්. රත්නකලා<br>එස්. එම්. යූ. සෙනරත් බංඩාර | 820 | 08 |
| 04 | පොල්වත්ව මාර්ගය | දවුලගල නුවර ප්‍රධාන මාර්ගය | විරාගා දුන්නෑ පානගේ ඉඩම | විරාගා දුන්නෑපාන ඒකනායක | ඒ. ඩබ්. ලාල් වෙලගෙදර<br>කේ. ජී. එස්. කඳන්ගම<br>වයි. එම්. ගුණතිලක බණ්ඩා<br>ආර්. එම්. එස්. එම්. රත්නායක | 140 | 10 |

| අනු. අංකය | මාර්ගයේ නම | ආරම්භය | අවසානය | වම් පස පදිංචිකරුවන් | දකුණු පස පදිංචිකරුවන් | දිග (අඩි) | පළල (අඩි) |
|---|---|---|---|---|---|---|---|
| 05 | ලොකුඅංග කුඹුරු යාය හරහා අතුරු පාර | ලොකුඅංග ප්‍රධාන පාර | ලොකුඅංග ආරාමය | කේ. එම්. එස්. ජයතිලක බංඩා<br>බී. ආර්. එම්. හීංමැණිකේ<br>ඩී. ඇම්. පී. කේ. දිසානායක<br>ඒ. ඇම්. සෙනවිරත්න<br>ඒ. ඇම්. ගුණරත්න බංඩා<br>පූජ්‍ය අඹන්වල ගුණරතන හිමි<br>එම්. ඒ. කරුණාරත්න<br>ඩබ්. එම්. අබේසිංහ | එම්. ඒ. විජේරත්න බණ්ඩා<br>එච්. ඒ. පියරත්න<br>කේ. එම්. නිල්මිණී රූපිකා<br>ඒ. එම්. රත්නායක<br>ජී. කේ. එම්. ගුණරත්න බණ්ඩාර<br>එම්. ජී. මුතුබණ්ඩා | 1968 | 08 |
| 06 | අප්පල්ලාගොඩ ධර්මාපුරය ඇටඹේවල හරහා කෙහෙල් වලහේන මැදින් හඳුන්ගහ දෙණිය ගල දක්වා දිවෙන ගම්සභා පාර | වටදෙණිය බෝවල මාර්ගය | හඳුන්ගහදෙණිය | ඒ. එම්. හීම්මැනිකේ<br>යූ. එල්. ශිරානි මංගලිකා<br>එච්. ඩී. අයි. පී. සීල්වා<br>පී. ජී. ඩබ්. දයානන්ද<br>පී. ජී. ජානක නන්දසිරි<br>ආර්. එම්. සෝමරත්න<br>ඩී. ජී. විල්සන් | ඩී. ජී. යමුනා අයිරාංගනී<br>එච්. ඩී. අයි. පී. සිල්වා<br>පී. ජී. ජානක නන්දසිරි<br>ආර්. එම්. සෝමරත්න<br>ඩී. ජී. විල්සන් | 820 | 09 |
| 07 | ලොල්ලෙගොඩ හේන වත්ත හරහා වැටී ඇති ගෙදර කුඹුර පාර | සිරිල්ගේ තේ කඩය | පමුණුව ප්‍රාථමික විදුහල | | පී. ජී. චූලනී උපතිස්ස<br>ආර්. ජී, ශ්‍රියානි රාජපක්ෂ | 400 | 06 |

04 - 719

---

## පන්නල ප්‍රාදේශීය සභාව

වරිපනම් බදු නොගෙවීම මත තහනමට ගනු ලැබූ චංචල දේපල ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 158 වගන්තිය ප්‍රකාරව වරිපනම් ගෙවීමට අපොහොසත් වූ අයගේ දේපල තහනමට ගෙන ඇත.

එබැවින් 2015.05.07 වන දින පෙ.ව. 10.00 ට පන්නල ප්‍රාදේශීය සභාවට අයත් යක්විල උප කාර්යාලයේ දී පහත සඳහන් දේපල ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

01. පිත්තල පහන් 01
02. පිත්තල මල් පෝච්චි 02
03. සෝනි වර්ගයේ රූපවාහිනිය (ක්‍රියා විරහිත)
04. ස්ටෑන්ඩ් ෆෑන් 01

ලේකම්,
ප්‍රාදේශීය සභාව, පන්නල.

04 - 663

---

## මහනුවර මහ නගර සභාව

ගෝඝාතක ආඥාපනත

ගෝඝාතක ආඥාපනතේ 1272 අධිකාරිය අංක 17 (1) දරන වගන්තිය අනුව මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර නියමිත අධිකාරී තැන වූ මහනුවර පුරපති මහීන්ද්‍ර රත්වත්තේ වන මම 2015 වර්ෂය තුළ දී මහනුවර මහ නගර සීමාව තුළදී මෙහි පහත සඳහන් දිනයන්හි දී මස් පිණිස සතුන් මැරීම හා මස් වෙළඳාමත් දෙවැනි උපලේඛනයේ සඳහන් දිනයන්හි දී සතුන් මැරීමත්, මස් වෙළඳාමත් සම්පූර්ණයෙන් තහනම් කරමි.

### පළමුවැනි උපලේඛනය

| | |
|---|---|
| 2015 ජනවාරි මස 04 වන ඉරිදා | දුරුතු පුර පසළොස්වක පෝය දිනය |
| 2015 පෙබරවාරි මස 03 වන අඟහරුවාදා | නවම්පුර පුර පසලොස්වක පෝය දිනය |
| 2015 මාර්තු මස 05 වන බ්‍රහස්පතින්දා | මැදින් පුර පසලොස්වක පෝය දිනය |
| 2015 අප්‍රේල් මස 03 වන සිකුරාදා | බක් පුර පසලොස්වක පෝය දිනය |
| 2015 මැයි මස 03 වන ඉරිදා | වෙසක් පුර පසලොස්වක පෝය දිනය |
| 2015 මැයි මස 04 වන සඳුදා | වෙසක් පුර පසලොස්වක පෝය දිනට පසු දිනය |

| | |
|---|---|
| 2015 ජුනි මස 02 වන අඟහරුවාදා | පොසොන් පුර පසලොස්වක පෝය දිනය |
| 2015 ජූලි මස 01 වන බදාදා | අධි ඇසල පුර පසලොස්වක පෝය දිනය |
| 2015 ජූලි මස 31 වන සිකුරාදා | ඇසළ පුර පසලොස්වක පෝය දිනය |
| 2015 අගෝස්තු මස 29 වන සෙනසුරාදා | නිකිණි පුර පසලොස්වක පෝය දිනය |
| 2015 සැප්තැම්බර් මස 27 වන ඉරිදා | බිනර පුර පසලොස්වක පෝය දිනය |
| 2015 ඔක්තෝබර් මස 27 වන අඟහරුවාදා | වප් පුර පසලොස්වක පෝය දිනය |
| 2015 නොවැම්බර් මස 25 වන බදාදා | ඉල් පුර පසලොස්වක පෝය දිනය |
| 2015 දෙසැම්බර් මස 24 වන බ්‍රහස්පතින්දා | උදුවප් පුර පසලොස්වක පෝය දිනය |

**දෙවැනි උපලේඛනය**

| | |
|---|---|
| 2015 ජනවාරි මස 04 වන ඉරිදා | (මීලා-දුන්-නබි) නබි නායකතුමාගේ උපන් දිනය |
| 2015 ජනවාරි මස 15 වන බ්‍රහස්පතින්දා | දෙමළ තෛයිපොංගල් දිනය |
| 2015 පෙබරවාරි මස 04 වන ඉරිදා | ජාතික දිනය |
| 2015 පෙබරවාරි මස 17 වන අඟහරුවාදා | මහා සිවරාත්‍රි දිනය |
| 2015 අප්‍රේල් මස 13 වන සඳුදා | සිංහල හා දෙමළ අලුත් අවුරුදු දිනට පෙර දිනය |
| 2015 අප්‍රේල් මස 14 වන අඟහරුවාදා | සිංහල හා දෙමළ අලුත් අවුරුදු දිනය |
| 2015 මැයි මස 01 වන සිකුරාදා | මැයි දිනය |
| 2015 ජූලි මස 18 වන සෙනසුරාදා | ඊදුල් පිතර් (රාමසාන් දිනය) දිනය |
| 2015 සැප්තැම්බර් මස 24 වන බ්‍රහස්පතින්දා | ඊදුල්-අල්හා (හජ්ජි උත්සව දිනය) |
| 2015 නොවැම්බර් මස 10 වන අඟහරුවාදා | දීපවාලී උත්සව දිනය |
| 2015 දෙසැම්බර් මස 25 වන සිකුරාදා | නත්තල් උත්සව දිනය |

මීට අමතරව විශේෂ හේතුවක් මත රජය විසින් හා මා විසින් නියෝග කරනු ලබන වෙනත් දිනයන්වලදී .

මහීන්ද්‍ර රත්වත්තේ,
මහනුවර පුරපති.

මහනුවර මහ නගර සභා කාර්යාලයේ දී ය.

04 - 661

---

**කලවාන ප්‍රාදේශීය සභාව**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 14 හා 24 (2) වගන්ති යටතේ කරනු ලබන දැන්වීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24 වැනි වගන්ති ප්‍රකාර සබරගමුව පළාත් සභාවේ, රත්නපුර දිස්ත්‍රික්කයේ කලවාන ප්‍රාදේශීය සභාව විසින් මෙහි පහත උපලේඛනයේ දක්වා ඇති මංමාවත්, කලවාන ප්‍රාදේශීය සභාව සතු මංමාවත් වශයෙන් ප්‍රකාශයට පත් කරනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

දැනට ප්‍රාදේශීය සභාව විසින් මැන සලකුණු යොදා ඇති මෙම මංමාවත් සම්බන්ධයෙන් අදාළ ඉඩම්වල අයිතිකරු ලෙස හිමිකම්පාන පාර්ශවයන් විසින් යම් විරුද්ධතාවයක් පලකරනු ලබන්නේ නම්, මෙම නිවේදනයේ සිට එක් මසක් ඇතුළත තමන්ගේ අයිතිය ඔප්පු කිරීම සඳහා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24 (2) වගන්ති ප්‍රකාර ක්‍රියා කරන ලෙස මෙයින් දැනුම් දෙනු ලැබේ.

කේ. විජිත කරුණාරත්න මයා,
සභාපති,
කලවාන ප්‍රාදේශීය සභාව.

2015 අප්‍රේල් මස 07 වැනි දින,
කලවාන ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

## උපලේඛනය

| අනු. අංකය | මාර්ගයේ නම | දිග (කි.මී.) | පළල (මීටර්) |
|---|---|---|---|
| 1 | බලවතුකන්ද තැන්නහේන පාර | 1 | 6 |
| 2 | කඩුමීරිය ඉහලගෙදර පාර | 1.5 | 6 |
| 3 | කුඩුමීරිය පොල්ගහකන්ද පාර | 1.25 | 6 |
| 4 | වැද්දාගල නැගෙනහිර කැරැපත පාර | 2 | 6 |
| 5 | තලගහපැල්පොල අතුරු මාර්ගය | 0.75 | 6 |
| 6 | කුඩව පිටකැලේ මාර්ගය | 3 | 6 |
| 7 | පෙතියකන්ද පල්ලෙදෙනිය පාර | 2.5 | 6 |
| 8 | කුඩව කෙලපත්තල පාර | 8 | 6 |
| 9 | කුඩව බූත්කන්ද පාර | 7 | 6 |
| 10 | ගෝනගලකන්ද සිට ගල්පල්ලහේන හරහා වැවගම දක්වා පාර | 3 | 6 |
| 11 | වත්තහේන කිරල්දෙනිය පාර | 1.5 | 6 |
| 12 | වංගුදොල අසල සිට කැටවලකන්ද පාර | 3 | 6 |
| 13 | උතුරු වැද්දාගල සිට කැවවලකන්ද පාර | 2.5 | 6 |
| 14 | උතුරු වැද්දාගල විද්‍යාලය අසල සිට කැටවලකන්ද පාර | 2 | 6 |
| 15 | උතුරු වැද්දාගල විද්‍යාලය අසල සිට පුහුල්පැල්පොල පාර | 4 | 6 |
| 16 | මාවතදෙනිය අසල සිට කැටවලකන්ද පාර | 2.5 | 6 |
| 17 | වැද්දාගල සිට පුහුල්පැල්පොල හරහා බලවතුකන්ද පාර | 4 | 6 |
| 18 | වැද්දාගල සිට පුහුල්පැල්පොල හරහා වැවගම පාර | 8 | 6 |
| 19 | සිංහරාජ පාරේ සිට මියනපලාව පාර | 3 | 6 |
| 20 | වැද්දාගල සිට පුහුල්පැල්පොල හරහා වැවගම පාර | 2.5 | 6 |
| 21 | මිල්ලගස්හේන සිට කුඩව විද්‍යාලය දක්වා පාර | 1 | 6 |
| 22 | කුඩව පෙතියකන්ද කරුවලදොල දක්වා පාර | 1.5 | 6 |
| 23 | කුඩව සිට පිටකැලේ හරහා අතුරුදොල පාර | 0.75 | 6 |
| 24 | පුහුල්පැල්පොල සිට පෙතියකන්ද පාර | 6 | 6 |
| 25 | පනාපොල කඩවත හරහා සිංහරාජ පාර | 8 | 6 |
| 26 | පනාපොල සිට හපුගොඩ දක්වා පාර | 4 | 6 |
| 27 | ගමගෙපැත්ත සිට කොන්ගහකන්ද පාර | 3 | 6 |
| 28 | කොස්ගුලන සිට කොන්ගහකන්ද පාර | 2.5 | 6 |
| 29 | වැද්දාගල කුඩුමීරිය පාර | 6 | 6 |
| 30 | දෙල්ගොඩ ගෝනලකන්ද හරහා පාර | 7 | 6 |
| 31 | වැද්දාගල මුදුනේ ගොඩැල්ල පාර | 1.5 | 6 |
| 32 | වැද්දාගල දොන්සිමා දෙනිය පාර | 2 | 6 |
| 33 | උතුරු වැද්දාගල කැටවලකන්ද 5 කනුව පාර | 2.5 | 6 |
| 34 | කලවාන ගැස්නාපොත්ත පාර | 6.5 | 6 |
| 35 | මියනපලාව තලගහපැල්පාල පාර | 3 | 6 |
| 36 | පුහුල්පැල්පොල බටහේන පාර | 2 | 6 |
| 37 | වතුරාව පොත්දෙනිය පාර | 1.5 | 6 |
| 38 | අඹගහකන්ද පැලවත්ත පාර | 2.5 | 6 |
| 39 | වැද්දාගල සමුපකාරය අසලින් බලවතුකන්ද පාර | 3 | 6 |
| 40 | එලවැල්ල කොක්කාවිට පාර | 4 | 6 |
| 41 | වැද්දාගලවත්ත පාර | 1.5 | 6 |
| 42 | වැද්දාගල නාගහහේන පාර | 0.5 | 6 |
| 43 | පුබුදුගම පාර | 1.5 | 6 |

**කෑගල්ල ප්‍රාදේශීය සභාව**


1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24(3) ආ වගන්තිය යටතේ කරනු ලබන දැන්වීමයි

1989 අංක 12 දරන (අනුෂාංගික විධිවිධාන) පනතේ දෙවන වගන්තිය සමක කියවිය යුතු 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24 (1) ආ වගන්තිය ප්‍රකාරව කටයුතු කරමින් 24(1) ආ වගන්තිය ප්‍රකාරව 2014.10.24 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* iv (ආ) කොටසෙහි ප්‍රකාශයට පත් කරන ලද පහත සඳහන් උපලේඛනයේ සඳහන් මාර්ග කෑගල්ල ප්‍රාදේශීය සභාව සතු මාර්ග ලෙස මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

ඩී. එම්. උපාලි දිසානායක,
සභාපති,
කෑගල්ල ප්‍රාදේශීය සභාව,
බුළුරුප්ප, හෙට්ටිමුල්ල.

| | | |
|---|---|---|
| පාරේ නම | - | දෙමටගොල්ල සිට තැඹිලිහේන්පිට දක්වා යන පාර |
| වසම | - | ගොඩිගමුව |
| දිග | - | අඩි 330 |
| පළල | - | අඩි 10 |

| *අනු අංකය* | *පාරේ වම් පස* | *අනු අංකය* | *පාරේ දකුණු පස* |
|---|---|---|---|
| 01 | කේ.ඩී. සුනිල් ප්‍රේමරත්න | 01 | කේ. ඩී. ගාමිණී වීරසිංහ |
| 02 | එච්. පී. ප්‍රේමදාස | 02 | කේ. ඩී. ආනන්ද |
| 03 | එච්. පී. රණසිංහ | 03 | එච්. පී. අමරසිංහ |
| | | 04 | එච්. පී. නිශ්ශංක |
| | | 05 | එච්. පී. ආතර් |






ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.